# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,587 – 2009 ජනවාරි මස 30 වැනි සිකුරාදා – 2009.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**සංශෝධනයයි**

**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය**

"ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට (අධිසේවක පදනම මත) පත් කිරීමට අයදුම්පත් කැඳවීම"

2008.08.29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 1 කොටස (11අ) ඡේදය යටතේ "ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය ක්‍රියාත්මකව පවත්නා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල ක්‍රමසම්පාදන කටයුතුවල නිරත නිලධාරින් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ II වැනි පන්තියේ II වැනි ශ්‍රේණියට (අධිසේවක පදනම මත) පත්කිරීම සලකා බැලීම සඳහා අයදුම්පත් කැඳවීම" මැයෙන් පළකරන ලද නිවේදනයේ 02 ඡේදයේ (අ) සිට (ඊ) දක්වා සඳහන් අයදුම්කළ හැකි නිලධාරි කාණ්ඩ පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු සංශෝධනය කරනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම්*.-2000.05.30 දිනට බලපැවැත්වෙන ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවා ව්‍යවස්ථාවේ "ඉ" පරිශිෂ්ඨයේ සඳහන් පහත සේවාවල නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කළ හැක.

(අ) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන්
(ආ) සංවර්ධන නිලධාරීන්
(ඇ) සංඛ්‍යාලේඛන සහකාරවරුන් (මුදල් හා ක්‍රමසම්පාදන විෂයය භාර අමාත්‍යාංශය)
(ඈ) ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් (යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය)
(ඉ) ව්‍යාපෘති නිලධාරීන් (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය)
(ඊ) සංවර්ධන සහකාර (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය) (දැනට සංවර්ධන නිලධාරි)

ඉහත සංශෝධනය හැර ගැසට් නිවේදනයේ සඳහන් අනෙකුත් විධි විධාන නොවෙනස්ව පවතිනු ඇත. 2008.08.29 දිනැති ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කළ අය නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අතර, මෙම නව සංශෝධන යටතේ අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබන්නන් ඔවුන්ගේ අයදුම්පත් කලින් ගැසට් නිවේදනයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කර 2009.02.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ බත්තරමුල්ල, පැලවත්ත, විභාග කොමසාරිස් ජනරාල් වෙත ලියාපදිංචි කරන ලද තැපැල් මඟින් යැවිය යුතුය. ඉල්ලුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රමසම්පාදන සේවයට (අධිසේවක පදනම මත) පත්කිරීමේ සීමිත තරඟ විභාගය" යන්න පැහැදිලිව ලිවිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එස්. අබේසිංහ,
ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2009 ජනවාරි මස 12 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

01-742

---

### විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සංශෝධනයයි**

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරඟ විභාගය - 2007**

අංක 1581 සහ 2008.12.19 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියට බඳවා ගැනීම සඳහා වන 2007 සීමිත තරඟ විභාගයට අදාළ ගැසට් නිවේදනයේ 1 ඡේදය යටතේ සම්මුඛ පරීක්ෂණය ලෙස දක්වා ඇති ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු වේ :-

"වාචික පරීක්ෂණය : ලිඛිත විභාගයේ සියළුම ප්‍රශ්නපත්‍රවලට පෙනී සිටි සෑම ප්‍රශ්න පත්‍රයකටම 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තා වූ ද, අපේක්ෂකයන් සම්බන්ධයෙන් වාචික පරීක්ෂණය පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත".

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

01-777

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

### බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පූගොඩ**

අධිකරණ වෙත ඉදිරිපත් කරන භාණ්ඩ වලින් හිමිකම් නොපාන ලද හා රාජ සන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ වූ රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2009.02.14 වැනි දින පෙ.ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් අයෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර තම හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසියට සූදානම් කර ඇති භාණ්ඩ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණ සතුව පවතී.

05. වෙන්දේසියෙන් ලබා ගන්නා ලද භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, ගෙවීම් සියල්ලම මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ ලබා ගැනීමට අදහස් කරන සෑම අයෙකුම තමාගේ ජාතික හැඳුණුම්පත රැගෙන පැමිණිය යුතුය.

ඩබ්ලිව්. පී. එස්. නිශ්ශංක,
දිසා විනිසුරු,
පූගොඩ.

2009 ජනවාරි මස 08 වැනි දින,
පූගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 01. | 81966 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 01යි |
| 02 | 86861 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| 03 | 5191 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| 04 | 80415 | ii. | ගෑස් ලිප් | 01යි |
| 05 | 5540 | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 01යි |
| | | i. | ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ii. | ගෑස් ලිප් | 02යි |
| | | iii. | ගෑස් රෙගියුලේටර් | 01යි |
| 06 | අංක රහිත | | ගෑස් ලිප් | 03යි |
| 07 | 63028 | | නොකියා වර්ගයේ ජංගම දුරකථන | 01යි |
| 08 | 56969 | | බාල්දි | 01යි |
| 09 | 56970 | | බාල්දි | 01යි |
| 10 | 57702 | | සවල් | 01යි |
| 11 | 57703 | | බාල්දි | 01යි |
| 12 | 57711 | | බාල්දි | 01යි |
| 13 | 57712 | | බාල්දි | 01යි |
| 14 | අංක රහිත | | බාල්දි | 02යි |
| 15 | 57706 | | බාල්දි | 01යි |
| 16 | 57707 | | බාල්දි | 01යි |
| 17 | 53273 | | බාල්දි | 01යි |
| 18 | 50626 | i. | උදළු | 01යි |
| | | ii. | බාල්දි | 01යි |
| 19 | 64878 | | බාල්දි | 05යි |
| 20 | 64876 | 1. | බාල්දි | 02යි |
| | | ii. | සවල් | 01යි |
| 21 | 65080 | | බාල්දි | 05යි |
| 22 | 65079 | 1 | බාල්දි | 09යි |
| | | ii. | සවල් | 01යි |
| 23 | 65582 | | බාල්දි | 01යි |
| 24 | 65583 | | බාල්දි | 01යි |
| 25 | 65625 | | බාල්දි | 01යි |
| 26 | 65626 | | බාල්දි | 02යි |
| 27 | 65627 | | බාල්දි | 04යි |
| 28 | 65739 | | බාල්දි | 01යි |
| 29 | 65740 | | බාල්දි | 01යි |
| 30. | 65917 | | බාල්දි | 02යි |
| 31. | 65942 | | බාල්දි | 01යි |
| 32. | 65946 | | බාල්දි | 01යි |
| 33. | 65988 | | බාල්දි | 02යි |
| 34. | 66236 | | බාල්දි | 01යි |
| 35. | 66279 | | බාල්දි | 02යි |
| 36. | 66280 | | බාල්දි | 02යි |
| 37. | 66281 | | බාල්දි | 02යි |
| 38. | 66282 | | බාල්දි | 02යි |
| 39. | 66287 | | බාල්දි | 01යි |
| 40. | 5766 | | ඇළුමිනියම් මුට්ටි | 01යි |
| 41. | 43810 | | රවුම් කියත්තල | 01යි |
| 42. | 95500 | | යකඩ කම්බිකූරු තොගයක් | |
| 43. | ඒ/910/66 | | අංක කේ 2616 දරන මෝටරය හා ඩීඑම්වී කොළපාට එන්ජින් එක සහිත මැණික් ගැරීමේ උපකරණ කට්ටලය | |
| 44. | ඒ/220/07 | | හොන්ඩා වර්ගයේ වතුර මෝටර් | 01යි |
| 45. | ඒ/560/07 | i. | පී 100 හොන්ඩා වර්ගයේ වතුර මෝටර් | 01යි |
| | | ii. | ටයිගර් ක්ලැසික් වර්ගයේ රතු පැහැති කම්ප්‍රේෂර් ටැංකි | 01යි |
| | | iii. | ලෑලි රාමු | 01යි |
| 46. | ඒ/1930/07 | | HADEEL වර්ගයේ කැසට් රේඩියෝ | 01යි |
| 47. | 77221 | | පැනසොනික් ආර්එස් 510 කැසට්රේඩියෝ | 01යි |
| 48. | 48821 | | විදුලි ග්‍රයින්ඩර් | 01යි |
| 49. | 2933 | i. | රන්පැහැති ඉමිටේෂන් පෙන්ඩන්ට් | 01යි |
| | | ii. | රන් පැහැති ඉමිටේෂන් බැරල් මුදු | 01යි |
| | | iii. | රන් පැහැති ඉමිටේෂන් අත් පළඳනා | 01යි |
| | | iv. | ලණුවක හැඩයට අඹරන ලද රන් පැහැති ඉමිටේෂන් මාල | 01යි |
| | | v. | මලක හැඩයට පෙන්ඩනය සහිත රන් පැහැති ඉමිටේෂන් මාල | 01යි |
| | | vi. | රන් පැහැති ඔරලෝසු පටි කෑලි | 02යි |

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2009 පෙබරවාරි මස 06 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 2009 ජනවාරි මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

| අනු අංකය | නඩු අංකය | | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|---|
| 50. | 81949 | vii | මැද කොටස පුම්බා ඇති ඉමිටේෂන් වළලු බෆල් 02ක් සහ රේඩියෝ කැබලි අඩංගු පෙට්ටිය | 01යි |
| 51. | 95080 | | සිසිල් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| 52. | 95081 | i. | නැෂනල් වර්ගයේ අක්‍රීය රෙදි සෝදන යන්ත්‍ර | 01යි |
| | | ii. | අක්‍රීය තත්ත්වයේ ඇති වෝටර් කූලර් | 01යි |
| | | iii. | ෆිලිප්ස් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| | | iv. | සිසිල් වර්ගයේ අක්‍රීය ශීතකරණ | 01යි |
| | | v. | නැෂනල් වර්ගයේ දොරදෙක අක්‍රීය ශීතකරණ | 01යි |
| 53. | 94776 | i. | අංක ඩබ්පීඑච්ටී 4358 දරන ත්‍රිරෝද රථයේ අංක ඒජීඑම්බීකේජේ 82815 දරන එන්ජිම | |
| | | ii. | අංක ඩබ්පීඑච්ටී 4358 දරන ත්‍රිරෝද රථයේ ඉදිරිපස මුහුණත සහිත අංක 24 එෆ්බීකේජේ 60395 දරන චැසිය | |
| | | iii. | එහි පැති දොර සහ අමතර කොටස් අඩංගු කවරය | |
| 54. | 60551 | | කොළපාට ටෙන්ට් රෙදි | 01යි |
| | | | සිල්වර් පාට ටෙන්ට් රෙදි | 01යි |
| 55. | ඒ/744/08 | | අංක ඒඑච් 50310021 දරන දිරාපත් පාපැදි | 01යි |
| 56. | ඒ/313/08 | | සින්කොපි වර්ගයේ අංක 07137 දරන නිකල්පාට කාන්තා පාපැදිය | |

01-745

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 සමාගම් ආඥාපනතේ ප්‍රකාරව පහත සඳහන් සමාගම 2008.12.31 වැනි දින ලියාපදිංචි කර ඇත.

සමාගමේ නම : ලීගල් රිසර්ච් ඇන්ඩ් කන්සල්ටන්සි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : PV 66645

ලියාපදිංචි ලිපිනය : අංක 220, පාක් රෝඩ්, කොළඹ 05

ජේසී ඇන්ඩ් කම්පැණි,
සමාගම් ලේකම්වරු.

අංක 41, ජනාධිපති මාවත,
කොළඹ 01.
01-746

---

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

එංගලන්තයේ ලීඩ්ස් LS 29 7RQ වෝර්ෆඩේල්හි බර්ලි, සැන්ඩ්හෝල්ම් ඩ්‍රයිව්, අංක 68 හි පදිංචි ජෝන් කැරොල් සහ හෙයිසල් කැරොල් යන අප දෙදෙනා විසින් අළුත්ගම ගඟබඩ පාරේ අංක 125/47 දරන ස්ථානයේ පදිංචි විජේතුංග පටබැඳිගේ සුභාජි දේශප්‍රිය සිල්වා වෙත ඇටර්නි බලය පවරමින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කමණී පී. ද සිල්වා ලවා ලියා සහතික කරන ලද අංක 3356 හා 2004 අගෝස්තු මස 14 වැනි දින දරන ඇටර්නි බලකරය වර්ෂ 2008 ක් වූ අගෝස්තු මස 16 වැනි දින අවලංගු කොට එය නීත්‍යානුකූලව අහෝසි කරන ලද බව අදාළ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමු.

ජෝන් කැරොල් සහ හෙයිසල් කැරොල්.

01-747

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2008 ජුනි 25 වැනි දින සිදු කරන ලද පහත සඳහන් සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඉන්ටනැෂනල් සයන්ටිෂන් ඇස්ට්‍රොලොජිකල් රිසර්ච් (ප්‍රයිවෙට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පී වී 64594

ලියාපදිංචි ලිපිනය : අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර, කලල්ගොඩ, පන්නිපිටිය.

සමාධි බණ්ඩාර මිය,
සමාගම් ලේකම්.

අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර,
කලල්ගොඩ,
පන්නිපිටිය.
01-789

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය, රාජගිරිය පාරේ අංක 71/14 හි පදිංචි හේමලතා අබේසිරි මුණසිංහ වන මා ප්‍රසිද්ධ නොතාරිස් අලංකා ඩී. ඇන්තනි විසින් ලියා සහතික කරන ලද අංක 08 දරන 2006.11.27 ඇටෝර්නි බලපත්‍රය මගින් වත්තල එඬේරමුල්ල සිළුමිණ මාවත, අංක 142/බී1හි පදිංචි තෙව්වාහන්දි තුසිතා නාමලි සිල්වා යන අයට දෙන ලද මාගේ ඇටෝර්නි බලය අවලංගු කළ බව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් තෙව්වාහන්දි තුසිතා නාමලි සිල්වා යන අය විසින් මින් ඉදිරියට මා වෙනුවෙන් කරනු ලබන කිසිඳු ගනුදෙනුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ඉහත සඳහන් සියලු දෙනා වෙත වැඩිදුරටත් දන්වා සිටිමි.

හේමලතා අබේසිරි මුණසිංහ.

2008ක් වූ දෙසැම්බර් මස 23 වැනි දින දී ය.
01-757

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

වර්ෂ 2004.12.23 වැනි දින දරන ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සුමිත් ධම්මික ද සිල්වා මහතා විසින් සහතික කළ අංක 191 දරන ඇටර්නි බලපත්‍රයේ ඇටර්නි බලපත්‍ර දීමනාකරු වන අම්බලන්ගොඩ, රන්දොඹේ, අංක 719 දරන ස්ථානයේ පදිංචි අංක 712782765 V දරන ජාතික හැඳුනුම්පත හිමි පෙරුමාදුර පාලිත චන්ද්‍රලාල් ද සිල්වා වන මම, ඉහත කී ඇටර්නි බලපත්‍රය මගින් අම්බලන්ගොඩ, රන්දොඹේ අංක 719 දරන ස්ථානයේ පදිංචි අංක 652030211 V දරන ජාතික හැඳුනුම්පත හිමි පෙරුමාදුර පාලිත චන්ද්‍රසෝම ද සිල්වා යන අයට දී ඇති ඇටර්නි බලය මෙයින් අවසාන කොට අවලංගු කරන බවට ද මින් මතුවට ඉහත කී පෙරුමාදුර පාලිත චන්ද්‍රසෝම ද සිල්වා මගේ ඇටර්නි බලකරු නොවන බවට ද, ප්‍රකාශ කරමි. තවද ඉහත අංක 191 දරන ඇටර්නි බලපත්‍රය නිසි පරිදි ඇටර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ පොතේ ජේද/පිටු 04/133 පත්ඉරුවේ 19 දින පොත් අංකය යටතේ ලියාපදිංචි කර ඇත.

පෙරුමාදුර පාලිත චන්ද්‍රලාල් ද සිල්වා.

2009 ජනවාරි මස 09 වැනි දින.
01-771

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව 2008 ඔක්තෝබර් මස 30 වැනි දින සිදු කරන ලද පහත දැක්වෙන සංස්ථාගත කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සෙන්ස් (Zenss) ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ අංකය : පී. වී. 66022

ලියාපදිංචි ලිපිනය : # 24, පළමු පටුමග, රත්මලාන.

සමාධි බණ්ඩාර මිය,
සමාගම් ලේකම්.

අංක 75/17, ශ්‍රී නන්ද ජෝතිකාරාම පාර,
කලල්ගොඩ,
පන්නිපිටිය.
01-776

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - මරදාන ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. එන්. සමරනායක විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2006.10.27 වැනි දින හා අංක 1278 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නාරනපිටි පතිරුන්නැහැලාගේ ෂදිෂ් පතිරන යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ පෙබරවාරි මස 24 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, උඩුගහ පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, කහතුඩුව පිහිටි කහතුඩුව ස්ටේට් නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක එම්. සමරනායක විසින් මැන සාදන ලද 2002.08.01 සිට 11 දක්වා දිනයන්හි අංක 8244 දරන පිඹුරේ ලොට් අංක 178 දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය : පර්චස් 10.7 යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.28 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහසක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
01-806/1

---

## ඩීඑෆ්සීසී බැංකුව
## (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන)

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 1423 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලවාය කෝරළේ, වීරසේකරගම පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සකසන ලද 2004 නොවැම්බර් මස 07 වැනි දිනැති අංක 4705 දරන පිඹුරු පතෙහි දක්වා ඇති කදිරේකුඹුර ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 1 පර්. 10

එහි පිහිටි සියල්ල සහිතව

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. සී. එච්. මැණිකේ විසින් සහතික කරන ලද 2006 ජූලි මස 31 වැනි දාතමින් යුතු අංක 1423 දරන උකස්කරය ප්‍රකාර වැල්ලවාය දුලීකා ටෙක්ස් නම් ව්‍යාපාරය පවත්වාගෙන යන රංජිත් ජයසිංහ සහ පරණගමගේ සුමනතිස්ස (මින් පසුව මෙහි 'හවුල්කරුවන්' ලෙස හැඳින්වෙන) යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කරන ලදුව, ගෙවීම්වල දී, පෙරොන්දු නිසියාකාරව ඉෂ්ට නොකරන ලද දේපළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 17 වැනි දින, (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය :

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 36,250 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර, සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.

දුරකථන අංකය : 011-2440366/77

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ පිළිගත්, පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ,
තක්සේරුකරුවෝ සහ
දේපළ ඒජන්තවරු.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com
වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com
01-819

---

## පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත් කුරු කෝරළේ දකුණේ, වැල්ලම්පිටියේ, කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාවට අයත් අඹතලෙන් පහල කිට්ටම්පහුව ග්‍රාමයේ පිහිටි අංක 44/16 දරන වඩාත් නිවැරදිව සඳහන් කරන්නේ නම් අංක 44/16 (කොටස) කිට්ටම්පහුව යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු පී. වෙතාචලම් විසින් සකස් කරන ලද 2004 ජූලි මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 980/2004 හි ලොට් අංක 2 බී ලෙස සඳහන් 'දෙහිගහපිටිය' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 7.00

*මාර්ගය සහ පිහිටීම .-* කොළඹ සිට ලෝ ලෙවල් පාරේ, වැල්ලම්පිටිය මං සන්ධියේ සිට මීටර් 175ක් දුරින්, වම් පසින් කොටුවිල පාර පිහිටා ඇත (විවියන් ගුණවර්ධන මාවත) මෙම පාරේ මීටර් 375ක් පමණ දුරින් වම් පසින් සිමෙන්ති අච්චු වැඩපලක් දක්වා දිවෙන මාර්ගයකි. මෙම පාරේ මීටර් 100ක් පමණ දුරින් දකුණත පැත්තේ මෙම දේපල පිහිටා ඇත. වැල්ලම්පිටියේ සිට මෙම දේපලට ඇත්තේ මීටර් 650කි. බස් මාර්ග අංක 134 සහ ලෝ ලෙවල් පාරේ ගමන් ගන්නා අනෙකුත් බස්රථ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද 2006 මාර්තු මස 30 වැනි දින දරන අංක 2019 සහ අංක 2020 දරන උකස්කරයන් මත, මොහොමඩ් දාවුද් මොහොමඩ් ශෆීක් විසින් පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී (සීමාසහිත පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් හා පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 20 වැනි දින (සිකුරාදා) පස්වරු 2.30 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය.:

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිළෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000.00 ට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 ජනවාරි මස 16 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද, 2009 ජනවාරි මස 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් ආදළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450, සීමාසහිත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකලය ලත්, ශ්‍රී ලංකාවේ
ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත් වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ ඉඩම්
අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com
වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com
01-790/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී-ගනේමුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ අළුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහනවයක් (අ. 0 රූ. 0 පර්. 19) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*පහත විස්තර කරනු ලබන අයුරු මාර්ග ප්‍රවේශය සමග.-* පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 බී ලකුණු කළ බෙදා වෙන්

කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහ අටක් (අ. 0 රූ. 0 පර්. 18) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම.

පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1995.06.21 දිනැති අංක 9413 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 සී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම හතරක් (අ. 0 රූ. 0 පර්. 3.4) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් එකී ඉඩම් පහත විස්තර කරනු ලබන ඉඩමේ අතුරු බෙදූ කොටස වේ :

පෙර කී පලුගහවෙල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් සාදන ලද 1992. 11.15 දිනැති අංක 8045 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකක් (අ. 0 රූ. 1 පර්. 1) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරුව ඊ 722/137 යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපල දෙදෙනාම ගනේමුල්ල පදිංචි ගම්මැදලියනගේ ඇන්තනී සුනිල් මැන්දිස් සහ ඈන් නිරෝෂන් ලෝපස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 20 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* -කොළඹ සිට මීගමුව ප්‍රධාන පාරේ මීගමුව තෙල්වත්ත හන්දියෙන් කිඹුලාපිටිය පාරට හැරී කිඹුලාපිටිය හන්දිය පසුකර 9 වන කි. මී. කණුව පසුකර මීටර් 500ක් ගිය විට කෝර්ට් කොලෝතින් ඇඟලුම් කර්මාන්ත ශාලාවට පෙර දකුණට ඇති ප්‍රාදේශීය සභා පාරේ මීටර් 700ක් ඉදිරියට ගිය විට අදාල දේපල හමුවේ.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2006.07.14 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2006.07.06 වැනි දින ද, වීරකේසරී පුවත්පතේ 2006.07.07 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% වන පළාත් අධිකාරී බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිළෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක 011-2696155, 011-2572940.
01-807

---

**සම්පත් බැංකුව පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

යූ. එල්. අයි. එස්. කේ. විජේසිංහ - ගිණුම් අංක 0023 1600 2028

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ සම්පත් බැංකුව පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.08.30 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2008.07.11 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද 2008.05.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් යන දිනපතා පුවත්පත්වල ද පළකරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස්එක් ලක්ෂ හැත්තෑපන්දහස් දෙසිය පහකුත් ශත අසූනවයක (රු. 31,75,205.89 ක් පමණයි) සම්පූර්ණ මුදල සහ රුපියල් විසිනව ලක්ෂ විසිඑක් දහස් නවසිය අසූහයකුත් ශත හතලිස් දෙකක (රු. 29,21,986.42ක් පමණයි) මුදල සඳහා වසරකට සියයට දාහතර (14%) බැගින් 2007 ජුනි මස 07 වැනි දින සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොලී මුදල ද, සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේනම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ෂොක්මන් සහ සමරවික්‍රම විසින් 2009.02.19 වැනි දින පෙ. ව./ප.ව. 10.30 ට සහ 2. 30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ, උඩුබද්දාව ප්‍රාදේශීය සභා සීමාව තුළ පලුගමුවේ පිහිටි 'අගරවත්ත' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් සාදන ලද 2002 නොවැම්බර් මස 13 දාතම හා අංක 4952 බී දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව කේ 206/66 හි ලියාපදිංචි කර ඇති එකී අංක 4952 බී දරන පිඹුරට අනුව උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අංක 4980 පිඹුරේ ලොට් 1 ද, දකුණට මාදම්පේ - උඩුබද්දාව ප්‍රධාන මාර්ගය ද සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් විස්සක් (අක්. 0 රූඩ් 0 පර්. 20) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස, එහි පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ එයට අදාල අනෙකුත් සියලු දේ හා සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කළ 2006 ජූලි මස 25 දාතම හා අංක 1590 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාර උකස් තබා පවරන ලදී.

වයඹ පළාතේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කිනියම කෝරළේ කටුගම්පොල හත්පත්තුවේ බිංගිරිය ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මුරුකන්ඩියේ පිහිටි 'තිඹිරිගහවත්ත' නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා විසින් සාදන ලද 2002 ජනවාරි මස 05 දාතම හා අංක 8126 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කොට නිරූපිත කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්ඉරුව එම් 126/294 හි ලියාපදිංචි කර ඇති එකී අංක 8126 දරන පිඹුරට අනුව උතුරට : හලාවත කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : අංක 8126 පිඹුරේ ලොට් 2ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, සහ බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම එකොලහක් (අක්. 0 රූඩ් 0 පර්. 7.11) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ හා සමගය.

ඉහත කී මුරුකන්ඩියේ පිහිටි 'තිඹිරිගහවත්ත' නමැති ඉඩමේ අංක 8126 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් ලකුණු කොට දක්වා ඇති කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ වෙලුම/පත්ඉරුව එම් 126/293 හි ලියාපදිංචි කර ඇති එකී අංක 8126 පිඹුරට අනුව උතුරට : හලාවත - කුරුණෑගල ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : අංක 8082 පිඹුරේ ලොට් 3 ද, දකුණටඃ මෙම ඉඩමේ ඉතිරි කොටස ද, සහ බටහිරට : අංක 8126 පිඹුරේ ලොට් 1 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් පහයි දශම අටයි නවයක් (අක්. 0 රූඩ් 0 පර්. 5.89) වන බෙදා වෙන් කොට සීමා නිර්නය කළ සම්පූර්ණ බිම් කොටස එහි පස, ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ හා සමගය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කළ 2006 ජූලි මස 25 වැනි දින හා අංක 1592 දරන උකස් බැඳුම්කරයේ බලය අනුව උකස් තබා පවරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගමේ ලේකම්.

01-818/6

---

**සෙලාන් බැංකුව පීඑල්සී - ප්‍රයිවෙට් බෑන්කින් යුනිට්**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ කඩුවෙල බත්තරමුල්ල ප්‍රාදේශීය සභා ඒකක සීමාව තුළ තලංගම උතුරු කොස්වත්ත පිහිටි බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සාදන ලද 2005 මැයි මස 04 වැනි දිනැති අංක 1851 ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කොටකිඹුලාවත්ත ඕවිට සහ අස්වැද්දුව කුඹුර සහ පලදයා කුඹුර නැමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම් සහ එහි පිහිටි සියලු දේ සහිත ඉඩමේ දැන් කඩුවෙල පාර, වරිපනම් අංක 246/ඒ දරන ලොට් 1 ඒ 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස්හතක් (අ. 0 රූ. 1 පර්. 37) නොහොත් හෙක්ටයාර් 0.19476 විශාල ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව පී 1626/147 හි ලියාපදිංචි කර ඇත.

මෙම දේපල දෙහිවල පදිංචි තිමලේන්ද්‍රන් රාගවාන් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 පෙබරවාරි මස 24 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම* .- කොළඹ සිට කඩුවෙල පාරේ බත්තරමුල්ල හන්දියට පැමිණ එතැන් සිට කෙලින්ම කඩුවෙල පාරේ තවත් කි. මී. 1ක් ඉදිරියට ගිය විට පාරේ දකුණු පස කඩුවෙල පාරට මුහුණලා අදාල දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම *රජයේ ගැසට් පත්‍රයේ* 2008.12.05 වැනි දින පළ වී ඇති අතර ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත් වල 2008.09.04 වැනි දින ද වීරකේසරී පුවත්පතේ 2008.09.09 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මුදලින් (10%) සියයට දහයක් ද, 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිළෙන් 1%ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු, විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති) සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංකය : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිරුකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
දුරකථන අංකය : 060-2068185, 011-2696155, 011-2572940.
01-808

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2006.08.22 වැනි දින හා අංක 2492 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පොල්වත්තගේ රවින්ද්‍ර ගෝමිස් සහ පොල්වත්තගේ ධර්මසේන ගෝමිස් යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2009ක් වූ පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ කළුබෝවිල, පිහිටි සිරිගල් මාවතේ වරිපනම් අංක 21 ඒ ලෙස දැක්වෙන කොස්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 2005.05.17 වැනි දින මැන සාදන ලද අංක 3368/9000 පිඹුරේ හි ලොට් අංක එක්ස් දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය රූඩ් 1යි, පර්චස් 26

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 වැනි දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
01-806/2

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - හලාවත ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඊ. පින්ටෝ විසින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියා සහතික කරන ලද්දාවූ 2004.05.27 වැනි දින හා අංක 4194 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වර්ණකුලසූරිය නිමල් නිකලස් ප්‍රනාන්දු සහ වීරපුරගේ රංජිත තරංග යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල 2009ක් වූ පෙබරවාරි මස 19 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත මහ ලේකම් කොට්ඨාසය තුළ ලියාපදිංචි වී ඇති මුන්නේස්වරම් පත්තුවේ උතුරු පිටිගල් කෝරළයේ ඉනිගොඩවෙල ග්‍රාමසේවක කොට්ඨාසයට අයත් ඉනිගොඩවෙල ග්‍රාමයෙහි 'සීදූව වත්ත' නමැති ඉඩමට බලයලත් මානක එම්. එම්. පී. ඩන්ස්ටන් පෙරේරා විසින් 2001.04.16 වැනි දින මැන සාදන ලද අංක 3388 පිඹුරේ හි ලොට් අංක 2 දරන ඉඩම් කොටස වේ.

විශාලත්වය - පර්චස් 39.93

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.14 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.26 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද ;
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද ;
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද ;
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද ;
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම)
උසාවි කොමසාරිස් , තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
01-806/3

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - ගාල්ල නගර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ) විධිවිධාන පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී. කිව්. 116) හි අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර බලයලත් මානක අයි. කොටම්බගේ විසින් 2001 අගෝස්තු මස 18 වැනි දින සාදන ලද අංක 1134 දරන පිඹුර පරිදි දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ සහ මහ නගර සභා සීමාව තුළ ගාලුපියද්ද පිහිටි වරිපනම් අංක 7 දරන අමන්තොට්ටම් හෙවත් විස්ට්‍රම් තොට්ටම් කියන ඉඩමේ ලොට් 2 දරන පර්චස් දහතුනයි දශම දෙකයි එකක් (අ. 0 රූ. 0 පර්. 13.21) හෝ (හෙක්. 0.0334) විශාල ඉඩම සහ වරිපනම් අංක 07 දරන ගොඩනැගිලි, භූමිය ගසකොළ වගාවන් සහ සියළු දේත් සමඟ වේ.

බටුවත්ත ඔටෝ ලෑන්ඩ් යන නාමය සහ විලාශය යටතේ වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අදිකාරම් බටුවත්ත ගමගේ අනුර ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2009ක් වූ පෙබරවාරි මස 20 වැනි දින ප. ව. 2.00 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.11.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, සහ 2008.11.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න.

විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.01.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2009.02.03 වැනි දින දිවයින, සහ අයිලන්ඩ්, පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*- ගාල්ල කඩවීදියේ, ඕල්කොට් පිළිරුව අසලින් පටන් ගෙන ඕල්කොට් මාවත ඔස්සේ යාර 350ක් පමණ කොට්ටඩිය මංසන්දිය දක්වා ගොස් දකුණට හැරී අබ්දුල් වහාබ් මාවත ඔස්සේ යාර 150 පමණ ගොස් නැවතත් දකුණට හැරී පෙට්ටිගල වත්ත හරස් පාරේ යාර 25ක් පමණ ගිය විට අදාල දේපළ දකුණු පසින් හමු වේ. අදාල දේපල එකී 11 වන හරස් පාරට යාබදව පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් සියයට දහයක් (10%) ;
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (01%) ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%) ;
4. නොතාරිස් ගාස්තුව රු. 2,000 ;
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500 ;
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් ;
7. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ ගාල්ල නගර ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වාණිජ මහාධිකරණය සහ
දිසා අධිකරණය,
බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
රාජ්‍ය සහ වාණිජ බැංකු,
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 130, මහවීදිය,
ගාල්ල.
දුරකථන අංක : 091-2234356
091-2234469
ෆැක්ස් අංකය : 091-2234467
01-792

### පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ) විධිවිධාන පනතේ 4 වැනි වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරී පත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවට අයත් දළුගම උප කාර්යාල අංක 1, දළුගම ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1997 නොවැම්බර් මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 1350 හි ලොට් අංක 4 (බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1992 ඔක්තෝබර් මස 08 වැනි දින දරන පිඹුරුපත් අංක 683 හි ඒකාබද්ධ කරන ලද ලොට් අංක A හා B හි උප කොටසක් වන) ලෙස සඳහන් 'කෝන්ගහවත්ත' සහ 'කහටගහවත්ත' ලෙස හැඳින්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද ඉඩම.

ඉඩමේ ප්‍රමාණය අක්. 0 රූඩ් 0 පර්. 5.8

එහි පිහිටි සියල්ල සහ 1997 නොවැම්බර් මස 20 වැනි දින දරන පිඹුරුපත් අංක 1350 ලොට් අංක 6 පිහිටි මාර්ග අයිතිය ද සමග.

*මාර්ගය සහ පිහිටීම* .- කොළඹ කොටුවේ සිට කොළඹ - මහනුවර 'ඒ 1' මහා මාර්ගයේ 10/2 බෝක්කුවට ආසන්නයේ, ඊට පෙර දකුණත දෙසට පිහිටි පෞද්ගලික පාරේ මීටර් 100ක් පමණ දුරින්, දකුණත පැත්තේ පිහිටා ඇත. එහි සිට කිරිබත්ගොඩට දුර කි. මී. 2ක් වන අතර කොළඹ කොටුවට දුර කි. මී. 10කි. බස් මාර්ග අංක 1, 19, 200 සහ නුවර පාරේ ගමන් කරන අනෙකුත් ඒවා.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොළවත්තගේ විසින් සහතික කරන ලද 2006 මැයි මස 08 වැනි දින දරන අංක 2063 උකස්කරය මත, මැදගමගේ චමින්ද ජයවීර විසින් පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී (සීමාසහිත පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් හා පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ) ට උකස් කරන ලදුව, බැඳුම්කරු විසින් ගෙවීම් ඉටුකර නැත.

පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2009 පෙබරවාරි මස 20 වැනි දින (සිකුරාදා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් මුදලින් ගෙවිය යුතුය. :-

1. ගැණුම් මිළෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. ගැණුම් මිළෙන් වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 90,000 ට නොඅඩු සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිළෙන් ඉතිරි 90% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 ජනවාරි මස, 15 වැනි දින සිලෝන් ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් ද, 2009 ජනවාරි මස, 16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද බලන්න.

වැඩි විස්තර, ඔප්පුව සහ වෙනත් අදාළ ලේඛන පරීක්ෂා කර බැලීමට සහ ලබා ගැනීමට කොළඹ 03, ගාලු පාරේ අංක 450, සීමාසහිත පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ කළමනාකරු -නීති අමතන්න.

දුරකථන අංක : 2565573, 2565565.

ෂොක්මන් සහ සමරවික්‍රම,
රජයේ අනුමත හා එකම ISO 9001 : 2000
සහතිකය ලත්,
ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ, පුරෝගාමී වරලත්
වෙන්දේසිකරුවෝ,
උපදේශක තක්සේරුකරුවෝ සහ
ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011-2588176
ඊමේල් :schokman@samera1892.com
වෙබ් අඩවිය : www.schokmanandsamerawickreme.com

01-790/1

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 1/29653/සීඩී1/026.

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 02 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කූරුකෝරළේ දූනගහපත්තුවේ, කදිරාන ග්‍රාමයෙහි පිහිටි උළුඅම්බලමවත්ත දැන් ගුරුගේ සන්ෆ්ලවර් ගාර්ඩන් නමින් හඳුන්වන ඉඩමට 2001.08.20 දින පී. ඩී. එන්. පීරිස් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1911 AA පිඹුර ප්‍රකාර ලොට් 8 ට මායිම, උතුරට :ලොට් 7 ද ; නැගෙනහිරට : ලොට් 24 (මාර්ග රක්ෂිතය ) ද; දකුණට: ලොට් 9 ද ; බටහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහයි බිංදුවක් (අක්. 00, රූ. 00, පර්. 13.50) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 972/186 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

01-803

---

**මහජන බැංකුව - නුගේගොඩ ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.19 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. ජාගොඩ මහත්මිය විසින් සහතික කරන ලද අංක 7539 සහ 2007.10.12 වන දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම බටකඩ ආචාරිගේ ශ්‍රියානි පුෂ්පලතා ජයසුන්දර මහත්මිය විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 7539 දරන බැඳුම්කරය මත රුපියල් තිස් හතර ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි සත හැත්තෑ දෙකක (රු.34,66,666.72) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් තිස් හතර ලක්ෂ හැට හය දහස් හයසිය හැටහයයි ශත හැත්තෑ දෙකක (රු.34,66,666.72) එකී මුදල ද 2008.06.12 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය විය යුතු වෙනත් මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම් ) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 7539 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උකස් කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත නාගරික කොට්ඨාස අංක 30 (වනාතමුල්ල) දෙමටගොඩ පිහිටියා වූ ද, දොස්තර ඩී. ද සිල්වා මාවතේ වරිපනම් අංක 315 දරන ඉඩමේ බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද අංක 3708 හා 1996 මාර්තු මස 07 දින දරන පිඹුරේ ලොට් A වශයෙන් ලකුණුකොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ අංක 317 දරන පරිශ්‍රය ද ; නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් සිල්වා මාවත ද; දකුණට : ශාන්ත මැතිව් විද්‍යාල පරිශ්‍රය ද ; බස්නාහිරට: : ශාන්ත මැතිව් විද්‍යාල පරිශ්‍රය ද, මායිම් වන්නා වූ ද එකී අංක 3708 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම හයයි හයක් (අක්. 0, රූඩ්. 0, පර්. 1.66) හෙවත් වර්ග මීටර් 42.0 ක් විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

ඉහත දැක්වෙනුයේ පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි :

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුළ අංක 30 (වනාතමුල්ල) නාගරික කොට්ඨාසයේ දෙමටගොඩ පිහිටියා වූ ද, දැන් දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවතේ වරිපනම් අංක 315 දරන ස්ථානයේ

බලයලත් මිනින්දෝරු එස්. ටී. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 1471 හා 1974 දෙසැම්බර් 15 දින දරන පිඹුරේ ලොට් අංක 18 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එකී පිඹුරේ ලොට් අංක 17 ; නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත ද; දකුණට : දොස්තර ඩී. ද සිල්වා මාවත සහ ශාන්ත මැතිව් විද්‍යාලය ද ; බස්නාහිරට : ශාන්ත මැතිව් විද්‍යාලය ද, මායිම් වන්නා වූ ද, එකී අංක 1471 දරන එකී පිඹුරට අනුව පර්චස් එකයි දශම අටයි හයක් (අ. 0, රූ, 0, පර්. 1.86) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A702/276 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි ආදිය ද වේ.

පහත දැක්වෙන මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව ඇතුළත අංක 30 (වනාතමුල්ල) නාගරික කොට්ඨාසයේ, දෙමටගොඩ, දෙමටගොඩ පාරේ පිහිටියා වූ ද එකී අංක 1471 දරන පිඹුරේ ලොට් අංක 14 (පැසේජය හා මාර්ගය) ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තාවූ ද, උතුරට එකී අංක 1471 දරන පිඹුරේ ලොට් අංක 1 සිට 11 දක්වා වූ කොටස් සහ 33 දරන කොටස ද, නැගෙනහිරට : දොස්තර ඩැනිස්ටර් ද සිල්වා (බේස්ලයින් පාර) මාවත ද ; දකුණට : ශාන්ත මැතිව් විද්‍යාලය සහ පරිශ්‍රය ද; බස්නාහිරට : දෙමටගොඩ පාරේ වරිපනම් අංක 566 දරන පරිශ්‍රය ද මායිම් වන්නා වූ ද එකී අංක 1471 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම එකයි එකක් (අ. 0, රූ. 0, පර්. 6.11) විශාල වූ ද කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A702/277 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 977/06, 07 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
01-785

---

**මහජන බැංකුව - හෝමාගම ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ලියනගේ මහත්මිය, විසින් සහතික කරන ලද 2007.03.15 දින අංක 2791 සහ 2007.03.15 දින සහතික කරන ලද අංක 2792 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම, නාඹටුන්න බඩල්ගේ වසන්ත මහතා, විසින් පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර මත රුපියල් දහසය ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතක (රු.16,33,333.37) මුදලක් සහ රුපියල් දාහතර ලක්ෂ හතලිස් දහස් හත්සිය අටයි ශත තිස් තුනක (රු. 14,40,708.33) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දහසය ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත තිස් හතක (රු. 16,33,333.37) එකී මුදල ද 2008 මාර්තු 16 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එම මුදල මත, වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් තවදුරටත් වූ පොලිය ද රුපියල් දාහතර ලක්ෂ හතලිස් දහස් හත්සිය අටයි ශත තිස් තුනක (රු.14,40,708.33) මුදලක් සහ 2008.04.16 වැනි දින සිට ඒ මත වර්ෂයකට සියයට දහඅටයි දශම පහ (18.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 2791 හා 2792 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝමාගම පිහිටියා වූ ද "හෙරලිගස් වත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද අංක 1331 සහ 1998 මැයි 16 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කොට නිරූපනය කර ඇත්තා වූද, උතුරට : 56/ඒ/93 දරන පිඹුරේ ලොට් අංක 5 ද; නැගෙනහිරට : අංක 1179 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 ද ; දකුණට : අංක 56/ඒ/93 පිඹුරේ ලොට් අංක 7 සහ මෙම ඉඩමේ ලොට් අංක 2 සහ පාර ද ; බස්නාහිරට: අංක 56/ඒ/93 පිඹුරේ ලොට් අංක 6 හි ඉතිරි කොටස ද, මායිම්වන්නා වූ ද, එකී අංක 1331 දරන පිඹුරට අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල වූ බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේත් ය.

පහත දැක්වෙන මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ :

බලයලත් මිනින්දෝරු ඒ. ඩී. එම්. ජේ. රූපසිංහ විසින් සාදන ලද අංක 1331 හා 1988 මැයි 16 දින දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස නිරූපණය කර ඇති පර්චස් දශම හතරයි හතක් (අ. 0, රූ, 0, පර්. 0.47) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස.

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 1473/36 හා 1711/185 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
බටහිර කලාප II.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
(කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.
01-783

---

**මහජන බැංකුව- උඩුරගස්මංහන්දිය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඞී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.24 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් 2006.06.30 දින ලියා සහතික කරන ලද අංක 744 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, හේවගේ අසංක යනප්‍රිය සමරසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (21,64,540.25) ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2008.04.05 දින සිට වර්ෂයකට 16.5% බැගින් රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (21,64,540.25) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් විසිඑක්ලක්ෂ හැටහතර දහස් පන්සිය හතලිහයි ශත විසිපහ (රු. 21,64,540.25) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 744 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණීය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, කරන්දෙණිය දකුණ, මාගල ගමෙහි පිහිටි පරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. පී. වීරවර්ධන විසින් 2006.04.06 යන දින මැන සාදන ලද අංක 2306 දරන පිඹුරේ නිරූපිත අංක 18125 දරන කැබැල්ලට මායිම්, උතුරට : ටී. පී. 222176 ද, නැගෙනහිරට : පාර ද (අඩි 14 ක් පළල පාර); දකුණට : ටී. පී. 222293 දරන කැබැල්ල ද ; බස්නාහිරට : ටී. පී. 3873 හි එම් 404 සහ එන් 404 දරන කැබැලි ද යන මෙකී සතර මායිම් තුළ පිහිටි රූඩ් 02, පර්චස් දහඅටක් (අක්. 0, රූඩ් 02, පර්චස් 18) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලුම දේ ද වේ. මෙම ඉඩම බලපිටිය ඉඩම් දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A249/170 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර, ගාල්ල.
01-786

---

**මහජන බැංකුව - දෙහිවල ගාලු පාර ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.28 වන දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද අංක 160 සහ 2006.02.02 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම මොහමඩ් කාසිම් මොහමඩ් අලි මහතා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී බැඳුම්කරය මත රුපියල් දහසය ලක්ෂ දහ දහස් අටසිය අනූ එකයි සත හතක (රු.16,10,891.07) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් දහසය ලක්ෂ දහ දහස් අටසිය අනූ එකයි සත හතක (රු.16,10,891.07) එකී මුදල ද, 2008.06.02 වන දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද, එකී මහජන බැංකු පනතේ 29 ඕ වගන්තිය යටතේ අය කර ගත යුතු මුදල් ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අය කර ගැනීම සඳහා අංක 160 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු සමන්මලී රාමනායක මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**දේපළ සහ පරිශ්‍රය පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත රත්මලාන උතුර පිහිටියා වූද, "රත්මලාන එස්ටේට් " යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද අංක 1354 හා 1993 ජූලි 21 දින දරන පිඹුරේ ලොට් "B1" ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 13 ද, නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් "B2" දරන කොටස ද, දකුණට : එකී පිඹුරේ ලොට් අංක 72 ද, බස්නාහිරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 19ද, මායිම්වන්නාවූ ද එකී අංක 1354 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම හයයි දෙකක් (අක්. 0, රූ. 0, පර්. 8.62) ක් විශාල වූද ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M1957/252 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි පන්සල පාරේ වරිපනම් අංක 104/1C දරන ගොඩනැගිල්ල ද වේ.

පහත දැක්වෙන ඉඩම උඩින් සහ දිගේ මාර්ග ප්‍රවේශ අයිතිය සහ වෙනත් අයිතීන් ද මීට ඇතුළත් වේ:

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රිකක්යේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව ඇතුළත රත්මලාන උතුර පන්සල පාරේ පිහිටියා වූ ද, "රත්මලාන එස්ටේට් " යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද අංක 1354 හා 1993 ජූලි 21 දින දරන පිඹුරේ ලොට් B2 ලෙස ලකුණු කර ඇත්තා වූද, උතුරට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 13 ද, නැගෙනහිරට : අංක 773 දරන පිඹුරේ ලොට් A දරන කොටස ද, දකුණට : අංක 330 දරන පිඹුරේ ලොට් අංක 72 දරන කොටස ද, බස්නාහිරට :අංක 1354 දරන පිඹුරේ ලොට් B1 දරන කොටස ද, මායිම් වන්නා වූ ද එකී අංක 1354 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම එකයි බින්දුවක් (1.10) විශාල වූද, ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 1957/253 යටතේ ලියාපදිංචි කර ඇත්තා වූද වරිපනම් අංක 104/1C දරන ගොඩනැගිල්ල සහිත මුළු ඉඩම් කොටස.

ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M/2932/45, 46 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.
01-784

---

**කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 327377.

2008 ජූලි මස 10 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

රාගම ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. සී. ඩී. එස්. එස්. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද, කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද, 2001 අප්‍රේල් මස 27 වැනි දින හා අංක 6901 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, මහවත්තගේ දොන් ලාලිකා මාකරන්ද ණයකරු හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිපන්ලක්ෂ පනස්හත් දහස් නවසිය හතලිස් පහක (රු. 25,57.945) මුදලක් 2008 මැයි මස 15 වන දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් විසිපන්ලක්ෂ පනස්හත් දහස් නවසිය හතලිස් පහක (රු. 25,57,945) මුදලට 2008 මැයි මස 16 වන දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 15,00,000ක මුදල මත 25%ක පොළිය ද සහ රු. 4,91,849ක මුදල මත 32%ක වැඩිදුර වාර්ෂික පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදලත්, අඩුකොට එකී අංක 6901 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තා වූ ද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද, දේපළ සහ පරිශ්‍රය, කොළඹ 12, හල්ප්ස්ඩෝප් වීදියේ, අංක 99 හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කරගනී.

**උපලේඛනය**

බලයලත් මානක කෘෘස් දාබරේ විසින් 1993 ජූනි මස 10 වැනි දින සහ 14 වැනි දින සාදන ලද අංක 6107/1993 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, නවම් මහර පිහිටි කජුගහකුඹුර ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 1ඒ දරන ඉඩමට මායිම්, උතුරට : ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද ; නැගෙනහිරට : ලොට් 1බී ද ; දකුණට : පාර ද සහ බස්නාහිරට : කනත්ත සහ ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද, යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දාහතයි දශම දෙකයි පහක් (අ. 1, රූ. 1, පර්. 17.25) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 294/244 වෙළුමේ/පිටුව යටතේ ලියාපදිංචිව ඇත.

එකී අංක 6107/1993 දරන පිඹුරේ ලකුණු කරන ලද ලොට් 1ඒ දරන ඉඩම බලයලත් මානක එස්. ජී. ගුණතිලක විසින් 2001 අප්‍රේල් මස 17 වැනි දින මැතක දී නැවත බෙදීමක් කොට සාදන ලද අංක 1705 දරන පිඹුර පරිදි ඊට මායිම්, උතුරට: ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත ද ; නැගෙනහිරට : අංක 6107/1993 දරන පිඹුරේ ලොට් 1බී සහ මෙම ඉඩම අතරින් ඇල පාරක් සඳහා වෙන් කරන ලද ඉඩම ද, දකුණට : නවම් මහර පාර ද සහ බස්නාහිරට : ශ්‍රී ලංකා නාවික කඳවුරට අයිති කුරුඳුවත්ත සහ මිනී කනත්ත ද, යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දාහතයි දශම දෙකයි පහක් (අ. 1, රූ. 1, පර්. 17.25) විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

ආර්. ආර්. දුනුවිල,
සමාගම් ලේකම්.

01-793

---

**නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 752 සහ 2007 අගෝස්තු මස 02 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය නුගේගොඩ වනාත පාරේ අංක 38 දරන ස්ථානයේ පදිංචි අනුර විතානාරච්චි යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තවද ඉහත කී අනුර විතානාරච්චි ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් හැත්තෑලක්ෂ නවදහස් එකසියතිස්හයකුත් ශත හැත්තෑපහක මුදලක් (රුපියල් 70,09,136.75) සහ 2008.08.26 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වන රුපියල් හැටතුන්ලක්ෂයක මුදල (රුපියල් 63,00,000) මත සහ 2008.08.26 දිනට බැංකු අයිරා මත ගෙවීමට තිබෙන මුදල වන රුපියල් එක්දහස් හාරසියයක මුදල (රුපියල් 1,400) මත වැල් පොළී පදනම මත එකඟ වූ පරිදි 2008.08.27 දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ගංගොඩවිල පිහිටි වනාත පාරේ 2 වන පටුමගේ වරිපනම් අංක කලින් 5 ද, වර්තමානයේ දී 38 ද දරන මිල්ලගහවත්ත හෙවත් මහවත්ත සහ කැටකෙලගහවත්ත හෙවත් මහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 5302 සහ 1991 ඔක්තෝබර් මස 02 දින දරන පිඹුර ප්‍රකාර ලොට් බී වඩාත් නිවැරදිව සඳහන් කළහොත් ලොට් බී 1 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට: 2 වන පටුමග ද ; නැගෙනහිරට: වනාත පාර ද ; දකුණට : වනාත පාරේ වරිපනම් අංක 36 ද ; බස්නාහිරට: ලොට් ඒ ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5302 දරන පිඹුර අනුව පර්චස් දාහතරයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 14.7) විශාල බිම් කැබැල්ලය. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 1805/118 යටතේ ලියා පදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
01-744/3

---

**නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 නොවැම්බර් මස 26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්.එම්.පී.පී. එන්. මහීපාල විසින් ලියා සහතික කරන ලද අංක 45 සහ 2005 දෙසැම්බර් මස 26 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය දෙහිවල එපිටහිල් වීදියේ, ඇල ඉවුර පාරේ අංක 134 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් නිලාම් මොහොමඩ් අබුසලාම් යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී මොහොමඩ් නිලාම් මොහොමඩ් අබුසලාම් ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

ඉහත කී රුපියල් පනස්තුන්ලක්ෂ විසිහයදහස් හයසිය තිස්හතරකුත් ශත අනූහතක මුදල (රුපියල් 53,26,634.97) සහ 2008.10.08 වන දිනට අයිරා මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් පනස්දෙලක්ෂ අනූනවදහස් නවසිය හැත්තෑහතරකුත් ශත අනූහතක මුදල (රුපියල් 52,99,974.97) මත එකඟ වූ පරිදි 2008.10.09 වන දින සිට විකිණීමේ දිනය

තෙක් වැල්පොළී පදනම මත තවදුරටත් පොළිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් හි එන්. ඩී. ඩී. පී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ මහනගර සභා සීමාව තුළ දකුණු වැල්ලවත්ත නාගරික කොට්ඨාස අංක 47හි පිහිටි වැල්ලවත්ත විවේකානන්ද පාරේ වරිපනම් අංක 30 6/6 දරන බලයලත් මිනින්දෝරු ජී. චන්ද්‍රසේන විසින් මැන සාදන ලද අංක 2001/153 සහ 2001.06.20 දින දරන සහාධිපත්‍යය පිඹුර ප්‍රකාර (6 වන මහලේ) 5944ඒ/F6/U6 වශයෙන් ලකුණු කරන ලද නේවාසික නිවාස ඒකකයට මායිම්, උතුරට : CEI දරන පොදු ප්‍රදේශයට ඉහළ විවෘත අවකාශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය ද, නැගෙනහිරට : CEL දරන පොදු ප්‍රදේශයට ඉහළ විවෘත අවකාශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය සහ මෙම ඒකකය සහ 5944ඒ/F6/U7 දරන ඒකකය වෙන් කරන බිත්තියේ මධ්‍යය ද ; දකුණට : CEI3 දරන පොදු ප්‍රදේශයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තිය ද ; බස්නාහිරට: 5944A/F6/U5 දරන ඒකකයෙන් මෙම ඒකකය වෙන් කරන බිත්තියේ මධ්‍යය ද, ඉහළට : වහල ටෙරසයෙන් මෙම ඒකකය වෙන් කරන කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යය ද පහළට 5944A/F5/U4 දරන ඒකකයෙන් මෙම ඒකකය වෙන් කරන කොන්ක්‍රීට් තට්ටුවේ මධ්‍යය ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2001/153 දරන සහාධිපත්‍යය පිඹුර අනුව වර්ග මීටර හැටහතරයි දශම අටයි තුනක (වර්ග මීටර 64.83) හෙවත් වර්ග අඩි හයසිය අනූහතයි දශම පහයි නවයක (වර්ග අඩි 697.59) විශාලත්වයෙන් යුක්ත ගෙබිමය.

මෙම 5944A/F6/U6 දරන ඒකකය නිදන කාමරයකින්, (වඩාත් නිවැරදිව කිවහොත් නිදන කාමර දෙකකින්) මුළුතැන්ගෙයකින්, පැන්ට්‍රියකින්, වැසිකිළි තුනකින් සහ ටෙරස දෙකකින් සමන්විතය.

තවද, සහාධිපත්‍යය දේපළේ පොදු ප්‍රදේශයෙන් මෙම 5944A/F6/U6 දරන ඒකකය සඳහා නොබෙදූ කොටස් අගය 2.125කි.

මෙම ඒකකය සඳහා ආසන්නතම පොදු ප්‍රවේශය CE 13 වේ.

මෙම ඒකකය වැල්ලවත්ත අංක 2 දරන ලියාපදිංචි පිඹුරේ ලොට් 5944හි A දරන ගොඩනැගිල්ලේ උපබෙදීමක ඒකකයකි.

මෙම 5944A/F6/U6 දරන ඒකකය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ CON.S.P. 13/156 යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, අංක 45 දරන ඔප්පුවේ දෙවන උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති පොදු අවකාශයන් ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
01-744/2

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එස්. සූරියආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 820 සහ 2006 ජූලි මස 13 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, සාංචිආරච්චි වත්ත ජාතික නිවාස යෝජනා ක්‍රමයේ අංක ජී3/6 දරන ස්ථානයේ පදිංචි දොඹෙකොටුවේ හන්ගිලිගෙදර දිලීප් කුමාර කුලරත්න යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උගස්කරු විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242, දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද,

තව ද, ඉහත කී දොඹෙකොටුවෙ හන්ගිලිගෙදර දිලිප් කුමාර කුලරත්න ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් හත්ලක්ෂ විසිපන්දහස් පන්සිය එකොළහකුත් ශත තිස්එකක රුපියල් (රු. 7,25,511.31) මුදලක් සහ 2008.09.14 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වශයෙන් රුපියල් හයලක්ෂ හතළිස්තුන්දහසක මුදල (රුපියල් 6,43,000) මත එකඟ වූ පරිදි 2008.09.15 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ."

**උපලේඛනය**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර මැද පළාත ගඩලාදෙණිය ගමේ පිහිටි (වර්තමානයේ එක් දේපළක් වන) උඩහේනවත්ත, දන්කොටුව සහ දොඹේකොටුවේගෙදරවත්ත කොටසක් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එල්. කේ. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක ජේ. 2363 සහ 2006 ජනවාරි මස 31 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3 දරන බිම් කොටසට මායිම් උතුරට : ශ්‍රී වික්‍රම සහ කීර්තිරත්න යන අයගේ උරුමක්කාරයන් අයිතිවාසිකම් කියන එම ඉඩමේ ම ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 4 (පාර) ද, බස්නාහිරට : ලොට් 2 සහ ඩී. එස්. අර්ලිස්හාමි විසින් අයිතිවාසිකම් කියන එම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක ජේ. 2363 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් විසිතුනයි දශම හයයි හතක (අ. 0 රූ. 1 පර්. 23.67) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි සහ සෑම සියළු දේත් සමගය. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 391/122 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
01-744/1

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අතරේ බෙදා හැරීමෙන් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 ඔක්තෝබර් මස 30 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

" කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද අංක 804 සහ 2007 ඔක්තෝබර් මස 22 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය හංවැල්ල, ඉහළ හංවැල්ල, අංක 556/11 දරන ස්ථානයේ පදිංචි සුසන්ත සමරකෝන් මහවෙදගේ යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඔහු විසින් කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති බැවින් ද, තව ද, ඉහත කී සුසන්ත සමරකෝන් මහවෙදගේ ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් දහතුන්ලක්ෂ දහනවදහස් අටසියඅසූනවයකුත් ශත හැටඑකක මුදලක් (රුපියල් 13,19,889.61) සහ 2008.09.03 දිනට කාලීන ණය මත ගෙවීමට තිබෙන මුල් මුදල වන රුපියල් එකොළොස්ලක්ෂ හතළිස්දහසක මුදල (රුපියල් 11,40,000) මත එකඟ වූ පරිදි 2008.09.04 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් තවදුරටත් පොලිය ද මාසික විරාම සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද එදින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ "

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ, මැද පත්තුවේ ඉහළ හංවැල්ලේ පිහිටි දියපරගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් මැන සාදන ලද අංක 5591 සහ 2007.10.08 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් 3 දරන බිම් කොටසට මායිම් උතුරට : ඩී. ලියනවඩු විසින් අයිතිවාසිකම් කියන දියපොරගහලන්දේ වත්ත ද, නැගෙනහිරට : අංක 5591 දරන පිඹුරේ ලොට් 4 ද, දකුණට : ගම්සභා පාර ද, බස්නාහිරට : අංක 5591 දරන ඉහත කී පිඹුරේ ලොට් 2 ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 5591 දරන පිඹුර අනුව පර්චස් පහළොවක් (අ. 0. රූ. 0, පර්. 15) විශාල බිම් කැබැල්ල සහ ඊට අයිති ගහකොළ, පළතුරු සහ ගොඩනැගිලි ආදි සියළු දේත් සමගය. මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එන් 182/28 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යුනියන් පෙදෙස,
කොළඹ 02.
01-744/4

---

**මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව**

**1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ:

"මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ විසින් සහතික කරන ලද 2004.12.03 දිනැති 1999 සහ 2007.07.09 දිනැති 4266 දරන උකස්කර ප්‍රකාර ගෙවිම් මරක්කල මානගේ මිල්ටන්, ජයවීර ලියන පටබැඳිගේ දර්ශනී සහ මරක්කල මානගේ සනි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 1999 සහ 4266 යටතේ රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසිඑකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදලක් සහ රුපියල් නව ලක්ෂ අසූ අට දහස් එකසිය හැටහයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.05.03 දින සිට වර්ෂයකට සියයට දහඅටයි දශම දෙකයි පහ (18.25%) බැගින් රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසි එකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදල සඳහා ද 2008.02.27 වැනි දින සිට වර්ෂයකට සියයට විසි හතර (24%) බැගින් රුපියල් නවලක්ෂ අසූ අට දහස් එකසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් හාරලක්ෂ අසූ දෙදහස් අටසිය විසි එකයි ශත හතලිස් හතක (රු. 4,82,821.47) මුදල සහ රුපියල් නවලක්ෂ අසූ අටහස් එකසිය හැට හයයි ශත හැත්තෑවක (රු. 9,88,166.70) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 1999 සහ 4266 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යකෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි"

**දේපළ පිළිබඳ විස්තරය**

1. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති දරන ප්ලෑන ප්‍රකාර ලොට් අංක 03 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 2 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක ඊ ද (දොඩම් පහල මහා විද්‍යාලීය භූමිය), දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 06 ද, බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් අංක 11 (පාර) ද, මායිම් වන පර්චස් එකොලහයි දශම එකයි නවයක් (අ. 0 රූ. 0 පර්. 11.19) විශාල ඉඩම සහ ඒ තුළ තිබෙන වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් කාර්යාලයේ ලියාපදිංචි බී 559/260හි ලේඛනගතව ඇත.

2. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර, දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995..03.25 දිනැති දරන ප්ලෑනේ ප්‍රකාර ලොට් අංක 06 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 3 ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක ඊ ද (දොඩම් පහල මහා විද්‍යාලීය භූමිය), දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 07 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ම ලොට් අංක 11 (පාර) ද, මායිම් වන පර්චස් එකොලහයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 11.37) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දැය ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ බී 559/261හී ලේඛනගතව ඇත.

3. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති ප්ලෑන ප්‍රකාර ලොට් අංක 01 සහ 4 දරන ඒකාබද්ධ කැබලිවලට මායිම්, උතුරට : කරගහවත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක 02 සහ ලොට් අංක 11 දරන අඩි දොලහක් පළල පොදු පාර ද, දකුණට : මෙම ඉඩමේ ම ලොට් අංක 05 ද, බස්නාහිරට : ප්‍රධාන ඉඩමේ ලොට් ඒ ද, මායිම් වන පර්චස් විසි දෙකයි දශම හතරයි හතරක් (අ. 0 රූ. 0 පර්. 22.44) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 598/136හි ලේඛනගතව ඇත.

4. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම් පහල පිහිටි ගින්නලිගොඩ ආර දංගහවත්ත නමැති ඉඩමේ ලොට් අංක බී සහ සී දරන ඒකාබද්ධ කැබලි බෙදූ බී. ජී. කරුණාදාස බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 967 සහ 1995.03.25 දිනැති ප්ලෑන ප්‍රකාර ලොට් අංක 05 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ම ලොට් අංක 4 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ම ලොට් අංක 11 දරන අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය ද, දකුණට : මෙම ඉඩමේ ම ලොට් අංක 08 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ම ලොට් අංක ඒ ද මායිම් වන පර්චස් එකොලහයි දශම බින්දුවයි හතක් (අ. 0 රූ. 0 පර්. 11.07) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියලු දෑ ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 560/163හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

ප්‍රදේශීය කළමණාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38 1/ඒ, පිට්ටනිය පාර,
මාතර.
01-787

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
# Sri Lanka Institute of Printing
## ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

*ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙහෙයවන පරිගනක මුද්‍රණ රටා (සිත්තම්) නිර්මාණය පිළිබඳ පාඨමාලාව - මාතලේ සහ බේරුවල ශාඛා*

***Certificate Course in Computer Graphic Designing at Matale and Beruwala Branches***

ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයන්ට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින රජයේ මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරයි.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥාපනතක් මඟින් ස්ථාපනය කරන ලද මෙම ආයතනය මුද්‍රණ සහ ග්‍රැෆික් ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් ග්‍රැෆික් පාඨමාලාව 2009 ජනවාරි මස ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මඟින් පවත්වනු ලබන මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මෙම පාඨමාලාවන් මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකසා ඇත.

මෙම පාඨමාලාව ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත්වීමට බලාපොරොත්තු වන නවකයින්ට මෙන්ම එම ක්ෂේත්‍රයන්හි නියැලී සිටින සේවක මහතුන් සඳහා විශේෂයෙන් සැකසුණ පාඨමාලාවකි. පරිඝණක ආධාරයෙන් ග්‍රැෆික්ස් නිර්මාණකරණය පිළිබඳව පුළුල් අවබෝධයක් මින් ලබාදෙන අතර ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග පිළිබඳ පුළුල් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුමක් ද ලබාදෙයි.

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | - | පැය 114 යි (මාස 4) |
| මාධ්‍යය | - | සිංහල/ඉංග්‍රීසි |
| ගාස්තුව | - | රු. 9,500 |
| වේලාවන් | - | සතිපතා සහ සති අන්ත පන්ති කීපයක් පැවැත්වේ. |

**Course Outline**

* **Introduction to Computers**
  (Hard Ware and Soft Ware for Graphics Industry)
* Introduction to **Adobe-Indesign** for Page Make-up
* Creating and Designing Vector Graphics Using **Macro Media Free Hand**
* Creating and Designing Vector Graphics using **Corel Draw**
* Creating and Designing Vector Graphics using **Adobe Illustrator**
* **Light and Colour**
  Colour Theory and Colour management, Pantone Traditional CMYK and Hexachrome Colour management Systems.
* How to use **Adobe Photoshop** as a Raster Graphic Image manipulation application
  Photoshop and Tools
  Image Correction and Image Manipulation
  Colour Corrections and Adjustment
  2D-3D in Photoshop
  Image Modes and Blending Modes
  Photoshop inbuilt and Third party plug-in Filters
  Using Layers, Channels and Basic Palettes
  Working with Paths and vector shapes
  Masking Systems in Photoshop
* **Scanning Technology** : How to use Scanner for printing Technology (From Black and White to Colour)
* **Out Put Techniques** : Colour Separations and Special Colour out putting
* Visit to Industry Bureaus and Printing Houses to understand the operations of Image Setters and Printing Processors.

මෙම පාඨමාලාවන්ට ඇතුළත් වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට පමණක් පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලැබෙන අතර පහත දුරකථන අංක වලින් අමතා සම්මුඛ පරීක්ෂණය සඳහා දිනයක් වෙන්කර ගන්න. පාඨමාලා සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් පිරිනැමේ.

*මාතලේ ශාඛාව :*
සමන්ත කුලතුංග,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
මාතලේ ශාඛාව,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන අංකය : 071-4895044,
060-2683839

*බේරුවල ශාඛාව :*
හරිත වැන්දබෝනා,
පාඨමාලා උපදේශක,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
බේරුවල ශාඛාව,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බේරුවල.
දුරකථන අංකය : 034-2279881.
0714-286261